# මාවනැල්ල ප්‍රාදේශීය සභාව

# කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 03 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන, 2010 මාර්තු 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , මාවනැල්ල ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) ස්ථාවර වත්කම් ලේඛණයෙහි ඇතුලත්ව ඇති රු.2,762,495 ක වත්කම් ප්‍රමාණයක් ගිණුම්ගත නොවීම හේතුවෙන් ශේෂ පත්‍රයෙහි ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබුණු වට්ටම් වටිනාකම වූ රු.28,730 ක් සෑහා ලද පොත්වල වටිනාකම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ශේෂ පත්‍රයේ පුස්තකාල පොත් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන දක්වා තිබුණි.

(ඇ) ශේෂ පත්‍රයෙහි ස්ථාවර වත්කම් යටතේ රු. 30,000 ක් ලෙස පෙන්වා ඇති හිඟුල වැසිකිලිය වසර කිහිපයකට පෙර කඩා ඉවත් කර ඇතත්, තව දුරටත් වත්කම් ලෙස පෙන්වීම තුලින් ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.206,205,629 ක් වූ අතර , උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු 194,524,627 ක් විය.

1.3.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු 17,555,590 ක් විය.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>

2011 අප්‍රේල් 18 දින වනවිට මාස 03 ක් කල් ඉකුත් වූ විගණන විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුමට භාජනය වූ ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු.1,379,772 ක් විය.

1.3.5 <u>අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය

| | නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ <u>තීරණ වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අංක 49 හා 52 වගන්ති | ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද සැලැස්මකින් තොරව ඉදිකර ඇති ගොඩනැගිලි , පනතේ විධිවිධාන ප්‍රකාරව කඩා ඉවත් කිරීමට බලය ප්‍රාදේශීය සභාව සතු වුවද, 2009 හා 2010 වර්ෂ තුල ඉදි කර ඇති අනවසර ගොඩනැගිලි 07 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ | |

මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මු.රෙ 371 (ආ) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් ලබාගත් මුදලකින් ඉතිරි මුදල් අදාල කාර්යය නිමකල විගසම පියවීම කලයුතු වුවත්, 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා විවිධ වැඩ සටහන් සඳහා ලබාදුන් රු. 221,950 ක් වූ අතුරු අග්‍රිම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ.570 | තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම ගිය තැන්පත්, කල් ඉකුත්වූ තැන්පත් ලෙස සලකා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වුවත් රු.118,284 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක් සියළු වාහන ඉන්ධන වලින් ටැංකිය සම්පූර්ණයෙන් පුරවා ධාවනය කර ඉන්ධන වැය වීම පරීක්ෂා කලයුතු වුවත් සභාව සතු වාහන 10 ක් සම්බන්ධයෙන් කිසිදු දිනක ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති අංක 2005/04 දරන චක්‍රලේඛය | |
| (i) | අංක 03(1) ජේදය | සභා බල ප්‍රදේශය තුල සිදු කෙරෙන ඉඩම් විකිණීම පිළිබඳව තොරතුරු හා විස්තර සභාවේ ආදායම් පරීක්ෂක/ පරිපාලක හා කාර්මික නිලධාරි මගින් ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ii) | අංක 03 (ii) හා (iii) ජේද | ඉඩම් විකිණීම් වලට අදාලව කට්ටි සැලැස්ම අනුමත කිරීමට පෙර විකිණීමට යටත් බිම් කොටස්වල විකුණුම් වටිනාකම පිළිබඳ සභාවේ ආදායම් පරීක්ෂක/ පරිපාලක |

මගින් තාවකාලික තක්සේරුවක් ලබා ගතයුතු අතර, එකී තක්සේරුව පදනම් කරගෙන විකුණුම් කරුගෙන් 1% කට සමාන වූ තැන්පත් මුදලක් ලබාගත යුතු වුවද අක්කර 05 ක් වූ හිද්දාදෙනියහේන ඉඩම වෙන්දේසි කිරීමේදී එලෙස තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව අත්තිකාරම් මුදල් ලබාගෙන තිබණි.

(iii) අංක 03 (vi) ඡේදය — විකුණනු ලබන ඉඩම් ප්‍රමාණයෙන් 10% ක භූමි භාගයක් පොදු කටයුතු සඳහා සභාව වෙත ඔප්පුවක් මගින් පවරා ගැනීමට කටයුතු කලයුතු වුවද, පරණ වලව් වත්ත, රොක්වීව්වත්ත, හා හිද්දාදෙනියේ හේන යන ඉඩම් වෙන්දේසි කිරීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි.

(iv) අංක 03(x) ඡේදය — සභාවේ ආදායම් පරීක්ෂක / පරිපාලක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට යවා ඉඩම් විකිණීමට අදාල ඔප්පු අංක හා වටිනාකම් පිළිබඳ විස්තර ලබා ගෙන විකුණුම් කරු විසින් සපයා ඇති විස්තර හා තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1993 දෙසැම්බර් 31 දින අංක පීපීඒ/6/1/1 දරන ජනාධිපති කාර්යාලීය චක්‍රලේඛය

(i) රජයේ නිලධාරීන් විදේශ සංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් දින 07 ක් තුල තම සංචාරය පිළිබඳව වාර්තාවක් පිළියෙලකර එය විදේශ ගමන අනුමත කල නිලධාරියා වෙත ඉදිරිපත් කලයුතු වුවද, සභාපතවරයා විසින් 2008-2010 කාලය අතරතුර දී යෙදුනු සංචාරයන් 05 සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) රජයට සම්බන්ධ පුද්ගලයින් විසින් යෙදෙන්නා වූ සියළුම නිල විදේශ ගමන් වලින් රටට යම් ප්‍රතිලාභයක් අත්විය යුතු බව දක්වා ඇතත් , ඉහත සඳහන් විදේශ ගමන් වලින් එවැනි ප්‍රතිලාභයක් අත්වී ඇති බව තහවුරු නොවීය.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදය

වැඩ කොන්ත්‍රාත් ගිවිසුමකදී ගොවි සංවිධාන වලට සුරක්ෂණයක් නොමැතිව රු.200,000 ක උපරිම මුදලක් අත්තිකාරමක් ලෙස ගෙවිය හැකි වුවද, එම ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුවෙකුට 2010 වර්ෂයේදී රු.400,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,124,752 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු11,764,328 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 |
| (i)වරිපනම් හා බදු | 9,013 | 3,459 | 13,530 | 4,010 | 3,086 | 6,667 |
| (ii)බදු කුලී | 10,500 | 11,013 | 720 | 10,000 | 9,518 | 2,606 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,300 | 1,483 | (140) | 1,000 | 960 | 151 |
| (iv) වෙනත් ආදායම් | 94,246 | 19,496 | 83,160 | 20,661 | 16,765 | 7,735 |

2.2.2.<u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු 8,674,767 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි .

2.2.3 <u>මුද්දර ගාස්තු</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු 19,855,975 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 <u>කඩ බදු</u>

(අ) ප්‍රාදේශීය සභාව විසින් කුලියට දෙනු ලබන යම් ස්ථානයකින් අයවිය යුතු කුලිය, අයවිය යුතු දින සිට දින 14 ක් ඇතුලත සභා කාර්යාලයට නෙගෙවා සිටියහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ159(1) වගන්තියේ විධිවිධාන අනුව කුලී නිවැසියාගේ චංචල හා නිශ්චල දේපල තහනමට ගෙන විකිණීමෙන් කුලිය අයකරගත යුතු බව දැක්වෙතත්, 2002 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන මස් හා මාළු කඩ හිඟ මුදල වූ රු.704,513 ක් එපරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මස් හා මාළුකඩ වෙළඳ අයිතිය වාර්ෂිකව බදු දීමේදී මධ්‍යම වෙළඳපොල අංක 02,03,04,05 කඩ කාමර සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

2.2.5 ජල ගාස්තු

දැනට ක්‍රියාත්මක නොවන මාවෙල ජල යෝජනා ක්‍රමයෙන් අයවිය යුතු වර්ෂ ගණනාවකට පෙර සිට පවතින හිඟ මුදල වූ රු.97,093 ක මුදල අයකර ගැනීම හෝ කපා හැරීම සිදුකර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැය ගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | | |
|---|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය | |
| ..... .... ... | ..... | ..... | ... .... | | රු | | රු |
| රු රු | රු | රු | | | | | |
| | 000 | 000 | 000 | 000 | 000 | 000 | |
| පුනරාවර්තන වියදම් | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 33,684 | 32,104 | 1,580 | 30,509 | 29,821 | 688 | |
| අනෙකුත් | 40,456 | 100,215 | (59,759) | 25,770 | 77,784 | (52,014) | |
| | ... .... ... | .... ... .... | | උප එකතුව | 74,140 | | 132,319 |
| (58,179) | 56,279 | 107,605 | (51,326) | | | | |
| ප්‍රාග්ධන වියදම | 60,473 | 28,681 | 31,792 | 88,100 | 39,476 | 48,624 | |
| | .... .... .... | ....... ... .... | | | | | |
| මුළු එකතුව | 134,613 | 161,000 | (26,387) | 144,379 | 147,081 | (2,702) | |
| | ====== | ====== | ====== | ======= | ===== | ====== | |

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර අගය රු.1,250,000 ක් විය.

2.5 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|

| | | |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 03 |
| ද්විතියික | 35 | 31 |
| ප්‍රාථමික | 57 | 56 |
| වෙනත් ( අනියම්,තාවකාලික) | - | 31 |

2.6 වත්කම් කළමනාකරණය

2.6.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති රු.1,731,289 ක අගයකට වූ භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

2.6.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු2,183,053 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 917,925 ක් විය.

2.6.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,618,625 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 112,673 ක් විය.

2.6.4 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර්31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු 4,200 ක් විය.

2.6.5 සමීක්ෂණය නොකළ වත්කම්

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.179,767,288 ක් විය.

2.7 හඳුනාගත් පාඩු හා හානි

(1) නියැදි විගණන පරීක්ෂණ වලදී සහ සභාවපවත්වා තිබූ තොරතුරු අනුව රු.1,143,585 ක අගයකට වූ පාඩු හා හානි අනාවරණය වී ඇත.

(11) හිඟුල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 කින් 2003 වර්ෂයේ සිට හිඟව පැවති රු.1,143,585 ක මුදලක් කපාහැරීමට අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන තිබුණි. ගිවිසුම් අත්සන් නොකිරීම හේතුවෙන් එම හිඟ මුදල අයකර ගැනීමට නොහැකි වී ඇත. නිලධාරීන්ගේ නොසැලකිලිමත් කම නිසා සභාවට සදුවූ මෙම පාඩුව

වගකිවයුතු අයගෙන් අයකර නොගෙන කපා හැරීම තුලින් සභාවට පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

2.8 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

2010 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂයෙහි ඇතුළත් වැටුප් ප්‍රතිපූර්ණ මුදල රු.1,740,732 ක් වූ අතර, එම අගය තුල සභා සේවකයින් දෙදෙනෙකුට අදාලව 2003 වර්ෂයේදී ප්‍රතිපූර්ණය නොවූ රු.152,140 ක වැටුප් මුදලක් ඇතුළත්ව තිබුණි.. මෙම පැරණි ශේෂය ප්‍රතිපූර්ණය කර ගැනීමට හෝ අනුමැතිය ගෙන කපා හැරීමට හෝ කටයුතු නොකර දිගින් දිගටම හිඟ ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි.

2.9 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

(අ) <u>සම්පූර්ණයෙන් අතහැර දමා ඇති ව්‍යාපෘති</u>

ඇස්තමේන්තු ගත පිරිවැය රු.100,000 බැගින් වූ කර්මාන්ත 02 ක් ඉටු නොකර සම්පූර්ණ යෙන් අත්හැර දමා තිබුණි.

(ආ) <u>ඉදිකිරීම්</u>

ඉදිකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී දක්නා ලද අඩුපාඩු පහත දැක්වේ.

(i) ඉහලගම පැරණි අම්බලම ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 10 පරිදි සවිකර තබූ දොරවල් 02 සඳහාද වැඩ විෂය අංක 02 යටතේ මිනුම් කර රු.4,350 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. කර්මාන්තයේ ගිවිසුමෙහි විෂය අංක 09 අනුව වර්ග 9.52 ක්වූ ඇස්තමේන්තුගත ප්‍රමාණය වැඩ නිම කිරීමේ මිණුම් වාර්තාව අනුව වර්ග 11.33 ක් ලෙස ගණනය කර වර්ග1.82 ක් සඳහා රු.21,720 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ඉහත සඳහන් කර්මාන්තයට අදාලව , ඇස්තමේන්තු හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා වැඩ විෂයයන් 05 ක ඉටු කරන ලද වැඩ හා ගෙවීම් වාර්තා අනුව රු.153,856 ක නොසැසඳීම් අනාවරණය විය.

(ii) ඉහත කර්මාන්තයේ ගිවිසුම හා ඇස්තමේන්තුව පරිදි කටයුතු නොකර කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවය මත සභාව කටයුතු කිරීම නිසා සංචාරක අමාත්‍යාංශය අනුමත කරන ලද වැඩ ඇස්තමේන්තුවට ගැලපෙන පරිදි , ඉදිකිරීම්

සිදුවී නොමැති බවත් , ඒ සඳහා ගෙවීම් වාර්තාව අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීමට නියමිත මුළු මුදල වූ රු.1,304,538 ට සාපේක්ෂව ගොඩනැගිල්ලේ නිමාව සිදුවී නොමැති බවත් , සංචාරකයින්ගේ සිත් ඇදගන්නා තත්වයකින් නොපවතින බවත් නිරීක්ෂණය විය.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් පාලනය